සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 09 ශ්‍රේණිය - 2024
## Second Term Test - Grade 09 - 2024

## සිංහල භාෂාව හා සාහිත්‍යය

කාලය පැය 02 යි

නම / විභාග අංකය:

## I කොටස

01. පහත දැක්වෙන වාක්‍යයේ **කළු කර** ඇති කොටසේ අර්ථයට වඩාත් හොඳින් ගැළපෙන අර්ථය තෝරා ඒ යටින් ඉරක් අඳින්න.

- **දිවෙන් දිව** ගාගෙන සිටි මිතුරෝ වෙඩි හඬින් බිය පත් ව සී සීකඩ දිවූහ.

1. දැඩි මිතුරු බවින් 2. දිවට දිව තියාගෙන 3. දැඩි සේ සතුරු ව 4. මිතුරු බව හඟවමින්

02. 'දැනුමෙන් හා ගුණ දහමින් පෝෂිත වූවෝ කිසිවකිනුත් කම්පා නොවෙති' මෙම අදහසට ගැළපෙන ආප්තෝපදේශය තෝරන්න.

1. උගතමනා ශිල්පයමයි මතු රැකෙනා
2. පිරුණු කළේ දිය නොසැලේ
3. හැදෙන ගහ දෙපැත්තෙන් දැනේ
4. අඟුරු කිරෙන් සේදුවත් සුදු නොවේ.

03. 'සතුට' යන පදයට සමානාර්ථයක් නොදෙන පදය තෝරා ඒ යටින් ඉරක් අඳින්න.

1. සන්තුෂ්ටිය 2. ප්‍රහර්ෂය 3. අමන්දානන්දය 4. අනාකුල

04. එකිනෙකට සමානාර්ථ ඇති යුගල පදය තෝරන්න.

1. නඩු හබ 2. වං හුං 3. ළමයි බමයි 4. අඟර දඟර

05. ව්‍යඤ්ජනාක්ෂරවල ලක්ෂණයක් නොවන ප්‍රකාශය පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් තෝරන්න.

1. තනිව උච්චාරණය කළ හැකි ය.
2. ස්වර සමඟ ව්‍යඤ්ජනාක්ෂර එක් වූ විට පහසුවෙන් උච්චාරණය කළ හැකි ය.
3. ව්‍යඤ්ජනාක්ෂරවලට ගාත්‍රාක්ෂර යන නම ද භාවිත වෙයි.
4. පිල්ලම් මගින් සංකේතවත් වන්නේ ව්‍යඤ්ජනාක්ෂර ය.

06. මූර්ධජ අක්ෂර පමණක් අන්තර්ගත ව ඇති අක්ෂර පේළිය තෝරන්න.

1. ට, ඩ, ධ, න, ම 2. ට, ඨ, ඩ, ණ, ෂ 3. ට, ඪ, ණ, ජ, ඥ 4. ට, ඨ, ත, ධ, ණ

07. ත - වර්ගයට අයත් අක්ෂරයක් යෙදී නැති වචනය තෝරා යටින් ඉරක් අඳින්න.

1. තාලම්පට 2. මද්දලය 3. ගැටබෙරය 4. බටනලාව

08. සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව දැක්වෙන පද පේළිය තෝරන්න.

1. නිරූපණය, ප්‍රවීණ, පරිගණකය, සම්භාවනීය
2. කනිෂ්ඨ, අධිෂ්ඨාන, තීක්ෂන, නිදර්ශන
3. සමස්ථ, ස්ථාවර, මාර්ගස්ථ, ප්‍රස්තාර
4. පිලිවෙළ, විස්මය, න්‍යෂ්ටික, තිරශ්චීන

09. පහත දැක්වෙන වාක්‍ය අතුරෙන් ක්‍රියා විශේෂණයක් ඇතුළත් වාක්‍යය තෝරන්න.

1. ඈත දියඹ තුළ ඔරුවක් පැද්දෙයි.
2. නිළියන්ගේ සිනා හඬ දසත පැතිරෙයි.
3. නර්තන ශිල්පියා නැටුමෙන් සැවොම පිනවයි.
4. වේගයෙන් සෙලවෙන ජලය තුළින් මත්ස්‍යයකු මතුවෙයි.

10. පහත දැක්වෙන ක්‍රියා පද අතුරෙන් ප්‍රයෝජ්‍ය ක්‍රියා පදය තෝරා ඒ යටින් ඉරක් අඳින්න.
   1. නටයි   2. නටව්   3. නටවයි   4. නට නටා

11. කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියාවක් යොදා පහත දැක්වෙන වාක්‍ය දෙක තනි වාක්‍යයක් බවට පත් කරන්න.
   - රාත්‍රියේ මහ වැසි ඇද වැටිණි.
   - පියා තෙමීගෙන නිවසට ගොඩ විය.

.......................................................................................................................................

12. පහත දැක්වෙන වාක්‍යාංශවලට යෝග්‍ය තනි පද ලියන්න.
   - කිසිවෙකුගේ පිහිටක් නැති - ..................................
   - කෙළෙහි ගුණ නොසලකන -....................................

13. 'නා' යන පදයට අර්ථයක් නොවන්නේ මින් කුමක් ද?
   1. ඇතා   2. ඇඳුරා   3. නාගයා   4. නායකයා

14. **'පොලිස් භටයෙක් සොරුන් ලුහුබඳියි'** මෙම වාක්‍යය කර්ම කාරකයට හැර වූ විට වඩාත් නිවැරදි ව පැවතිය යුතු අයුරු තෝරන්න.
   1. පොලිස් භටයකු විසින් සොරු ලුහුබඳිනු ලැබූහ.
   2. පොලිස් භටයකු විසින් සොරු ලුහුබැඳෙති.
   3. පොලිස් භටයෙක් විසින් සොරු ලුහුබඳිනු ලැබේ.
   4. පොලිස් භටයෙකු විසින් සොරා ලුහුබැඳෙයි.

15. පහත සඳහන් වාක්‍යය අතුරෙන් වඩාත් නිවැරදි වාක්‍යය වන්නේ කුමක් ද?
   1. මැණියෝ දරුවන්ට අවවාද දෙයි.
   2. වෛද්‍යවරු රෝගය හඳුනා ගත්හ.
   3. අවුරුදු උත්සවයට ඇතැමෙකු සහභාගී වෙති.
   4. තාරකා සමූහය අහසේ රටා මැවූහ.

16. **වෛද්‍යවරයාණන්, විශිෂ්ටයන්** යන පද දෙකේ උක්ත පද තෝරන්න.
   1. වෛද්‍යවරයාණෝ, විශිෂ්ටයෝ
   2. වෛද්‍යවරයා, විශිෂ්ටයා
   3. වෛද්‍යවරු, විශිෂ්ටයෝ
   4. වෛද්‍යවරයකු, විශිෂ්ටයකු

17. ධීවර භාෂාවේ දී **ජාලියෝ, මාරියාව** හා **හයිය** වන පදවල පොදු ජන වහර වන්නේ මින් කුමක් ද?
   1. දැල් අදින්නෝ, මුහුදු රළ හා වර්ෂාව සමඟ අහස ගර්ජනා කිරීම ය.
   2. මුහුදු රළ, දැල් අදින්නෝ හා වර්ෂාව සමඟ අහස ගර්ජනා කිරීම ය.
   3. මුහුදු රළ, වර්ෂාව සමඟ අහස ගර්ජනා කිරීම හා දැල් අදින්නෝ ය.
   4. වර්ෂාව සමඟ අහස ගර්ජනා කිරීම, මුහුදු රළ හා දැල් අදින්නෝ ය.

18. විරාම ලක්ෂණ යොදා පහත දැක්වෙන වාක්‍යය නැවත ලියන්න.
   - මොනවා මේ තරම් සුන්දර රටක් දෙව්ලොවවත් තියෙනව ද

.......................................................................................................................................

19. පහත අපිළිවෙළින් දක්වා ඇති වචන යොදාගෙන අර්ථවත් වාක්‍යයක් නිර්මාණය කරන්න.
අවශ්‍යතා/හුවමාරු/විවිධ/වන/ලිපි/ව්‍යාපාරික/ය/වෙනුවෙන්/ලිපි

.......................................................................................................................................

20. පහත දැක්වෙන පද්‍යය සම්පූර්ණ කරන්න.

මල් පිපෙන පොකුණු ද

..................................................

වතු පිටි මිණි මුතු ද

..................................................

(ලකුණු 2×20 = 40යි)

## II කොටස

- **ප්‍රශ්න අංක 1, 2, 3, 4 යන ප්‍රශ්නවලට හා 5, 6 යන ප්‍රශ්න දෙකෙන් එකකට පමණක් පිළිතුරු සපයන්න.**

(1) **පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.**

i. පියාසර කර ආමි - දේශයෙන් දේශයට
මගේ රට මට අගෙයි - තව්තිසාවට වැඩිය

(අ) මෙම ගීතයේ රචකයා නම් කරන්න.

(ආ) මෙම ගී කොටසට අනුව උපන් දේශය පිළිබඳ ආඩම්බරයක් ඇති කිරීමට හේතු වන කරුණක් ලියන්න.

ii. (අ) සද්ධර්මරත්නාවලිය අයත් සාහිත්‍යය යුගය හා රචකයා නම් කරන්න.

(ආ) සද්ධර්මරත්නාවලිය රචිත ශෛලිය කුමක් ද?

iii. කුමාරතුංග මුනිදාසයන් ළමා පරපුරේ ඥානය හා රසඥතාව වර්ධනය උදෙසා රචිත

(අ) පෙළපොත් ................................

(ආ) ප්‍රබන්ධ කතා ............................ දෙක බැගින් ලියන්න.

iv. (අ) විවිධ වෘත්තීන් හා බැඳුණු භාෂා ව්‍යවහාර හැඳින්වෙන්නේ කුමන නමකින් ද?

(ආ) ''නවම් මහේ නව වළල්ල'' පාඩම රචනා කිරීමට පාදක වූ කෘතිය කුමක් ද?

v. පහත සඳහන් කෘති රචනා කරන ලද රචකයන් ලියන්න.

(අ) සරු පොළොවක් අපට ඇතේ ...

(ආ) ළමා උයන...... (ලකුණු 2 x 5 = 10 යි)

(2) **පහත සඳහන් මඟ පෙන්වන ලද ඡේද අතුරින් එකක් තෝරාගෙන වචන 200කට නොඅඩු වන සේ රචනයක් ලියන්න.**

i. විශිෂ්ට ගුණාංගවලින් හා මනා පෞරුෂයකින් සමන්විත විශේෂ පුද්ගලයින් පිළිබඳ ලියූ චරිත කතා අපට කියවීමට මෙන් ම අසන්නට ලැබේ. ජීවිතයේ අනපේක්ෂිත බිඳ වැටීම් හමුවේ නොසැලී ඊට මුහුණ දී ලොව දස දෙස ජය දද නැංවූ විද්වත්හු ඒ අතර සිටිති. මෙවන් වූ චරිතවලින් අපට ලද හැකි ආදර්ශයන් බොහෝ ය. මෙම කරුණු සැලකිල්ලට ගනිමින් '**අභියෝග හමුවේ නොසැලුණු චරිත**' යන මාතෘකාව යටතේ රචනයක් ලියන්න.

ii. මත්ද්‍රව්‍ය උවදුර ශ්‍රී ලංකාවේ බරපතල ම සමාජ ප්‍රශ්නයකි. වර්තමානයේ එය පිටුදැකීම සඳහා විශාල සටනක් කිරීමට සිදුව තිබේ. ඒ සඳහා දැනටමත් ගෙන ඇති පියවර බොහෝ ය. මේ අදහස් සැලකිල්ලට ගෙන '**මත්ද්‍රව්‍ය උවදුර තුරන් කරමු**' යන මාතෘකාව යටතේ රචනයක් ලියන්න.

iii. නිල් අහස කළු දුමාරයකින් වැසුනා වැනි විය. දැඩි හිරු රැසින් පීඩා විඳිමින් සිටි ඉපල් ගැසුණු ගස්වල ඉතිරිව තිබූ වියළි කොළ සුළඟින් ගසාගෙන ගියේ ය. පරිසරය අඳුරු විය. නොබෝ වේලාවකින් මෙතෙක් පැවති දැඩි උණුසුම පහව යනු ඇත. ඉරිතැලුණු පොළොව සුවපත් වී තුරුලිය නව ජීවයක් ලබනු ඇත. මෙම කරුණු සැලකිල්ලට ගෙන '**නියඟය නිමා විය**' මාතෘකාව යටතේ රචනයක් ලියන්න.

iv. එදින රාත්‍රී ආහාරයෙන් පසුව මිහිර නිදාගන්නට සූදානම් විය. ඔහුට විහඟ ගෙනවිත් දුන් පොත ගැන සිහිපත් වූයේ ඒ අවස්ථාවේ දී ය. ඇත්තෙන් ම ඒ පොත තියෙන්නේ කොහිද? මිහිරගේ හිත තිගැස්සුණේ ය. ...... මෙතැන් සිට කතාව ලියන්න. සුදුසු මාතෘකාවක් ද යොදන්න.

(ලකුණු 20 යි)

(3) පෙළපොතේ ඇතුළත් පාඩම් ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. ''පුතේ මම බෙරේ කරේ දාගෙන හැතැප්ම ගණන් පයින් ගිය කෙනෙක්''

(අ) මෙය කාගේ ප්‍රකාශයක් ද?

(ආ) පුතේ යනුවෙන් ආමන්ත්‍රණය කර ඇත්තේ කාට ද?

ii. ''එසේ සිතාලා රාත් හැරගෙන බැදි දඩ මස් හා ලුණුත් එකුරුත්තේ බැඳගෙන මූල පලා මුලුත් හැරගෙන උන් රජගෙන් එන තෙක් මඟ බල බලා හිඳලා ...

(අ) මෙම පාඨයට අනුව මඟ බලා සිටියේ කවුද?

(ආ) මඟ බලා සිටි අයගේ සිතුවිල්ල කුමක් ද?

iii. ''ධීවර ජනයා මසුන් පන්න කිරීමට යාමේ දී ඉයත්තුව කෙරෙහි ද සැලකිලිමත් වෙයි. වාරකන් කාලයට මුහුද රළුවෙයි. විටින් විට ඇති වන කෝඩය ද මුහුදු යන්නාට පීඩාවකි.''

(අ) ඉහත පාඨයේ අන්තර්ගත ධීවර ව්‍යවහාරයේ යෙදෙන වචන තෝරා ලියන්න.

(ආ) එම වචනවල පොදු ව්‍යවහාර ලියන්න.

iv. ආදා සිට හිමයේ අපි සමගිව ඉඳ නි	තිනේ
රෑ දා වල් වත් පිළිවෙත් කළ දැයි සම සි	තිනේ
ආදාරෙක් ඔබ මිස නැත අම්මා හට ඉ	තිනේ
බාදා නොව ඔබ බුදුවන් අප දන් දුන් පි	නිනේ

(අ) පියා වෙනුවෙන් දරුවන් කරන ප්‍රාර්ථනය කුමක් ද?

(ආ) මෙම කවියේ අර්ථය ඔබේ වචනයෙන් ලියන්න.

v. ''දැන් අම්මාගේ තත්ත්වයේ හැටියට කිසිසේත් එය කළ නොහැකි යි''

(අ) මෙසේ ප්‍රකාශ කරන්නේ කවුද?

(ආ) මෙහි සඳහන් වන කළ නොහැකි දේ කුමක් ද? (ලකුණු 2×5 = 10)

(4) ජයබිම විද්‍යාලයේ ශිෂ්‍ය නායක පදක්කම් පැලැඳවීමේ උත්සවය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ ප්‍රධානත්වයෙන් පැවැත්වේ. ඒ සඳහා පැමිණෙන්නැ'යි ආරාධනා කරමින් දෙමාපියන්ට යැවෙන ආරාධනා පත්‍රය පිළියෙල කරන්න. (ලකුණු 10යි)

- **ප්‍රශ්න අංක 5, 6 දෙකෙන් එකකට පමණක් පිළිතුරු ලියන්න.**

(5) පහත සඳහන් කව්වල ඉතිරි පද ඔබේ සිතැගි පරිදි දී ඇති කවි පදවලට ගැළපෙන ලෙස සම්පූර්ණ කරන්න.

i. කෙත් යාය යි නිලට නිලේ
කොක්කු පෙළක් සුදට සුදේ
...................................................
...................................................

ii. හිරු හිනැහෙයි මල් පුබුදයි
සිසිල ගෙනෙයි සුළං හමයි
...................................................
...................................................

iii. රෑ අහසේ තරු පිරී
සඳ කුමරිගෙ සිත පිරී
...................................................
...................................................

iv. බිඳෙන් බිඳේ ජලේ
සෙමෙන් පිරේ කළේ
..................................................
..................................................

v. මම ආසයි කවි ලියන්න
ඔබ ආසයි ගී ගයන්න
..................................................
.................................................. (ලකුණු 2×5 = 10)

(6) **පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

එක්තරා මහලු ඍෂිවරයෙක් ගං ඉවුරක් දිගේ ගමන් කරමින් සිටියේ ය. අත්තෙන් අත්තට පනිමින් සතුටින් ගී ගයමින් සිටි කුරුලු යුවලක් ඔහුගේ ඇස ගැටිණි. ඍෂිවරයා මේ දර්ශනයෙන් සතුටට පත්විය. ඒ දෙස ම මඳක් බලා සිටියේ ය. මේ අතරතුර වැද්දකු විසින් විදින ලද හීයකින් කුරුල්ලා මැරී වැටිණි. කිරිල්ලිය ශෝකයෙන් විලාප දෙන්නට වූවා ය. මේ සිදුවීමෙන් ඍෂිවරයාගේ හදවත කම්පා විය. එතුමාගේ මුවින් එසැණින් ශෝක ගීතයක් පිට විය. මේ සිදුවීම මහා බ්‍රහ්මයාගේ නෙත ගැටිණි. එතුමා සිටියේ රාම සීතා කතාව ගීතයෙන් ලිවිය හැකි අයකු පිළිබඳ විමසිල්ලෙනි. ඍෂිවරයාගේ මුවින් පිට වූ ශෝක ගීතය අසත් ම එතුමාට සිතුණේ තමා සොයමින් සිටි කවියා හමු වූ බවයි. මහා බ්‍රහ්මයා ඍෂිවරයාට රාම කුමරුගේ ජීවිත කතාව කියා, එය ගීතයෙන් ලියන ලෙස ඉල්ලා සිටියේ ය. එය කල්පාන්තරයක් ලොව බබළනු ඇති බව ද කීවේ ය. ඒ කාව්‍ය නම් රාමායණයයි යි. ඍෂිවරයා වාල්මිකී ය.

i. මේ ඡේදයට අනුව ඍෂිවරයා සොම්නසට පත් වූ කරුණ කුමක් ද?
ii. කිරිල්ලිය දුකට පත් ව හැඬූ හේතුව ලියන්න.
iii. රාමායණයට පාදක වූ කතා වස්තුව කුමක් ද?
iv. ඍෂිවරයාගේ හිත කම්පාවීමෙන් පසු සිදුවූයේ කුමක් ද?
v. රාමායණය රචනා කළ කතුවරයා සහ එය රචනා කිරීමට ඇරයුම් කළේ කවරහු ද? (ලකුණු 2×5 = 10)